**කෝරලේපත්තු උතුර ප්‍රාදේශීය සභාව**
**මඩකලපුව දිස්ත්‍රික්කය**
**--------------------------**

**1.	මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1	මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-------------------------------**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 ජනවාරි 09 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 25 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූනි 19දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2	තත්ත්වාගණනය කළ මතය**
**------------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කෝරලේපත්තු උතුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3	තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**---------------------------------------------**

**1.3.1	ගිණුම්කරණ අඩුපාඩු**
**------------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත්කරුවෙකුට සභාවේ JCB යන්ත්‍රය, ජල බවුසරය ආදිය කුලියට දීමෙන් ලැබිය යුතු රු. 224,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | අදාල මුදල් අයකරගත යුතු අතර ඒවා ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි |
| (ආ) | පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් මිලදී ගෙන සභාවට ලබාදුන් පරිගණක ගිණුම්ගත කර නොතිබුණි. | මිලදී ගත් වත්කම්වල වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි |

**1.3.2	ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**
**-----------------------------------**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | විශ්‍රාම ගිය, සේවය හැර ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයකළ යුතු රු. 214,603 හිඟ ණය, විශ්‍රාම පාරිතෝෂිකයෙන් හෝ ඇපකරුවන්ගෙන් අදාල ඇපකර ගැනීම | අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි |

සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

| | | | |
|---|---|---|---|
| (ආ) | මහජනතාවට සභාව විසින් ජලය බෙදාහැරීමේ ගාස්තු රු.428,161ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | පිළිගනිමි |

**1.3.3 ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | අදහස් දැක්වීම |
|---|---|---|
| රු. 104,438,304 ක් වූ ගිණුම් විෂයන් 7 ක් සඳහා ඉඩම් ඔප්පු, වත්කම් ලේඛන, අයිතිය තහවුරු කිරීමේ ලේඛන, තොග ලේඛන ආදිය ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | ගිණුම් ශේෂ තහවුරු කිරීමේ ලේඛන, ඉදිරිපත් කළ යුතුවේ. | පිළිගනිමි |

**1.4 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දක්වා ඇත.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 12(1) සහ (2) වගන්තිය සහ පළාත් පාලන නිවාස ඉදිකිරීම් හා කර්මාන්ත අමාත්‍යාංශයේ 1988 ජනවාරි 13 දිනැති අංක 488/16 දරන ගැසට් නිවේදනයේ 31(1) උප වගන්තිය | ප්‍රාදේශීය සභාවේ කාර්යයන් ලිහිල් කිරීමේ අරමුණින්, සම්පූර්ණ වූ තීරණ ලබාගැනීමටත් සභාවේ අරමුදල්, ප්‍රතිපත්ති සැලසුම්, නිවාස ඉදිකිරීම්, සමාජ සංවර්ධනය, තාක්ෂණික සේවාවන්, පාරිසරික හා මහජන උපයෝගීතා වැනි කාරණා සඳහා වෙන වෙනම කමිටු ස්ථාපිත කර තිබුණත්, එම කමිටු විගණන දිනය වන 2020 මැයි 10 දින වන විටත්, කමිටු රැස්වීම් පැවැත්වීම සඳහා කටයුතු කර නොතිබුණි. | සභාවේ සෑම ක්‍රියාවක් වෙනුවෙන්ම වෙන වෙනම කමිටු පත් කිරීමට හා ඊට අදාල කාර්යයන් ඉටු කිරීමට පියවර ගත යුතුවේ. | පිළිගනිමි |
| (ආ) | 1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති මාලාවේ X පරිච්ඡේදයේ 193 වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා තථ්‍ය ආදායම් සහ වියදම් පිළිබඳ විස්තර අයවැය සැලැස්ම සමඟ සසඳා විචලනයන් සඳහා පැහැදිලි කිරීම් අඩංගු ප්‍රකාශයක් සකස් කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂය සඳහා තථ්‍ය ආදායම් සහ වියදම් පිළිබඳ විස්තර අයවැය සැලැස්ම සමඟ සැසඳිය යුතුවේ. | පිළිගනිමි |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.702,851 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු. 3,219,456 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලොචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,560,000 | 1,636,551 | 1,208,390 | 428,161 | 3,800,000 | 1,605.822 | 1,605,822 | - |
| කුලී | 3,925,000 | 3,336,627 | 3,129,127 | 207,500 | 4,197,000 | 1,753,339 | 1,723,726 | 29,612 |
| බලපත්‍ර ගාස්තු | 815,000 | 703,140 | 703,140 | - | 717,000 | 647,070 | 647,070 | - |
| අනෙකුත් ආදායම් | 7,405,000 | 1,067,700 | 877,450 | 190,250 | 2,920,000 | 1,630,140 | 1,630,140 | - |
| **එකතුව** | **14,705,000** | **6,744,018** | **5,918,107** | **825,911** | **11,634,000** | **5,636,371** | **5,606,758** | **29,612** |

#### 2.2.2 මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා සහ සියළුම බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දින වන විට මුද්දර ගාස්තු රු. 190,250 ක් ලැබිය යුතුව තිබුණි | 2019 වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු සියළු මුද්දර ගාස්තු පළාත් සභාවෙන් ලබාගැනීමට කටයුතු කළ යුතුවේ | ඉදිරියේදි මෙවැනි දෝෂ සිදුනොවන අයුරින් නිවැරදි කරනු ලැබේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **අතුරු ව්‍යවස්ථා**<br>1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභාවේ ආදායම් සහ වියදම් කිරීම් සඳහා ප්‍රධාන කාරණා සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සකස් කර ක්‍රියාත්මක කර තිබිය යුතුය. එසේ වුවත්, ප්‍රාදේශීය සභාව විසින් 2012 අගෝස්තු 04 දින අතුරු ව්‍යවස්ථා සම්බන්ධයෙන් යෝජනා නැගෙනහිර පළාතේ, පළාත් පාලන අමාත්‍යාංශයට අනුමැතිය සඳහා යවා තිබූ නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත්, ඒ සඳහා අනුමැතිය ලබා ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | සභාවේ අතුරු ව්‍යවස්ථාවන් නැගෙනහිර පළාතේ, පළාත් පාලන අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදුනොවන අයුරින් නිවැරදි කරනු ලැබේ. |
| (ආ) | **ක්‍රියාකාරී සැලැස්ම**<br>වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුවේ. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවන අයුරින් නිවැරදි කරනු ලැබේ. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභා අරමුදල් රු.875,000 කින් අවිධිමත් ආකාරයෙන් කොන්ත්‍රාත්කරුවෙකුට අත්තිකාරම් ලබා දුන් ආකාරයෙනුත්, ව්‍යාජ ඉටු නොකළ කාර්යයක්, ඉටුකළ බවටත්, තාක්ෂණික නිලධාරියෙකු විසින් නිකුත් කළ වාර්තාව නිසා රු. 255,000 ක් සහ සභාවේ යන්ත්‍රය කුලියට ලබාදීම මඟින් රු. 244,000 ක්ද සමඟ එකතුව රු.479,000 ක් වන කොන්ත්‍රාත්කරුගේ ගිවිසුම් ඇප මුදල් නිදහස් කළ නමුත් එම මුදල නොසැලකිලිමත්කම හේතුවෙන් අයකර ගෙන නොතිබුණි. | ලේකම්වරයාගෙන් සහ තාක්ෂණික නිලධාරීගෙන් අයකරගත යුතුවේ. | පිළිගනිමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2018 වර්ෂයේ රු.මිලියන 02 ක වියදමින් ආලම්කුලම් යන ස්ථානයේ ඉදි කළ කඩකාමර සංකීර්ණය නුසුදුසු ස්ථානයක ඉදි කළ බැවින් විදුලිය, ජල සැපයුම, වටේට වූ තාප්ප, වැසිකිළි පහසුකම් යනාදිය ඉදිනොකිරීම හේතුවෙන් කඩකාමර 08 ම පසුගිය වර්ෂ 2 ක් පුරා වසාදමා ආදායම් කිසිවත් ඉපැයීමකින් තොරව පැවතුණි. | අදාළ කඩකාමර සංකීර්ණය ආදායම් ඉපැයිය හැකි ආකාරයට ක්‍රියාත්මක කළ යුතුවේ. | පිළිගනිමි. |

### 3.3 වත්කම් කළමනාකරණය

### 3.3.1 වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සභාවේ ඉඩම් හා ගොඩනැගිලිවල මුළු එකතුව රු. 99,391,166 ක් ගිණුම්වල ඉදිරිපත් කර තිබුණත්, චංචල හා නිශ්චල දේපළ ස්ථාවර වත්කම් ලේඛනයේ ලේඛනගත කිරීම කර නොතිබුණි. | සියලුම චංචල හා නිශ්චල දේපල ස්ථාවර වත්කම් ලේඛනයේ ලේඛනගත කළ යුතුය. | පිළිගනිමි |

### 3.3.2 නඩත්තුව හා අලුත්වැඩියාවන් සිදුකිරීම

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව සතු බැකෝ යන්ත්‍ර 01 ක්, වතුර බවුසර් 01 ක්, ට්‍රැක්ටර් 02 ක්, කුඩා ප්‍රමාණයේ ට්‍රැක්ටරයක්, Mixer යන්ත්‍රයක්, ගල්රෝල දෙකක්, පීඩන යන්ත්‍ර 02 ක් වර්ෂ 03කට අධික කාලයක සිට අලුත්වැඩියා කිරීමට හෝ වෙන්දේසියේ විකිණීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | නියමිත කාලය තුළ අළුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි |
| (ආ) | තොග ගබඩාව විධිමත් ආකාරයෙන් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර අළුත්වැඩියා කළ යුතු වත්කම් අලුත්වැඩියා කිරීමට හෝ විනාශ කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදාල වත්කම් අළුත්වැඩියා කිරීමට හෝ වෙන්දේසි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | පිළිගනිමි |
| (ඇ) | රු.369,338ක් වටිනා CANON – FX 600 කැමරාව 2016 වර්ෂයේ සිට අක්‍රියව පැවතුණි. | අදාල කැමරාව අළුත්වැඩියා කර භාවිතා කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි |

**3.4 ප්‍රසම්පාදනය**

**----------------**

**ප්‍රසම්පාදන සැලැස්ම**

**------------------------**

| **විගණන නිරීක්ෂණ** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතුවේ. | ඉදිරියේදි මෙවැනි අඩුපාඩු සිදුනොවන අයුරින් කටයුතු කරනු ලැබේ. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**------------------------------------------**

**4.1 අභ්‍යන්තර විගණනය**

**-----------------------**

| **විගණන නිරීක්ෂණ** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී අභ්‍යන්තර විගණන කාර්යයන් ක්‍රියාත්මක කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන ඒකකයක් ක්‍රියාත්මක කළ යුතු වීම. | ඉදිරියේදි මෙවැනි අඩුපාඩු සිදුනොවන අයුරින් කටයුතු කරනු ලැබේ. |

**4.2 විගණන හා කළමනාකරණ කමිටු**

**-------------------------------------**

| **විගණන නිරීක්ෂණ** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර කමිටු රැස්වීම් පැවැත්විය යුතුවේ. | ඉදිරියේදි මෙවැනි අඩුපාඩු සිදුනොවන අයුරින් කටයුතු කරනු ලැබේ. |